සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
# ஆண்டிறுதி மதிப்பீடு - 2017
# Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ........................................................................................ විභාග අංකය :- ...........................

සැලකිය යුතුයි:
- I පත්‍රයේ ප්‍රශ්න වලට පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.
- II පත්‍රයට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා I පත්‍රයට අමුණා භාර දෙන්න.

---

## I පත්‍රය

- **ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් ම සුදුසු පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

(01) ගෝලීයකරණය නිසා ඇතිවන අවාසියක් දක්වෙන පිළිතුර තෝරන්න.
   (1) ජාත්‍යන්තර වෙළදාම පුළුල් වේ.
   (2) සංචාරක කර්මාන්තය දියුණු වේ.
   (3) නිෂ්පාදනය වැඩිවීම නිසා සම්පත් භාවිතය වැඩිවේ.
   (4) නව සංස්කෘතීන් පිළිබඳ දැනුම හුවමාරු වේ.

(02) පහත ප්‍රකාශය ඉදිරිපත් කරමින් පොත්පත් කියවීමේ අගය කියාදුන් ලේඛකයා වන්නේ,
   'පොතක පිටු අතර සැබෑ මිනිස්සු ජීවත් වෙති'
   (1) මුනිදාස කුමාරතුංග   (2) ප්‍රැන්සිස් බේකන්
   (3) ශ්‍රීමත් රිචඩ් ස්ටීල්   (4) ඊ.එම්. පෝස්ටර්

(03) තීරණ ගැනීමේ දී බුද්ධිමත්ව හා විචාරශීලීව තීරණ ගැනීම තුළින්,
   (1) ජීවිත ජයග්‍රහණ ලබාගත හැකිවේ.
   (2) අන් අයගේ සමච්චලයට ලක්වේ.
   (3) ආර්ථික අවාසි ඇතිවේ.
   (4) කාලය හා ධනය නාස්ති වේ.

(04) යහජීවන ගුණාංග ඇතුලත් පිළිතුර තෝරන්න.
   (1) සතුටින් සිටීම, සුහදබව, වංක බව
   (2) සතුටින් සිටීම, ලද දෙයින් සතුටු වීම, නිහතමානී බව
   (3) නිහතමානීබව, වංක බව, සුහද බව
   (4) නිහතමානී බව, කේන්තියාම, සුහද බව

(05) නිවැරදි තීරණ ගැනීම තුළින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය දියුණු කිරීමට දායක වූයේ,
   (1) සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතා ය.
   (2) ඩී. එස්. සේනානායක මහතා ය.
   (3) පොන්නම්බලම් රාමනාදන් මහතා ය.
   (4) පොන්නම්බලම් අරුණාචලම් මහතා ය.

Department of Education – Western Province

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රකාශන නිවැරදි නම් ''✓'' ලකුණ ද, වැරදි නම් ''×'' ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

(06) භූමිකම්පා ඇතිවීම, සුනාමි ඇතිවීම මානව ක්‍රියාකාරකම් නිසා ඇතිවන ආපදා තත්ත්වයන් ය. ( )

(07) ඖෂධ වර්ග භාවිතයේ දී නියමිත මාත්‍රාව ලබාගැනීමට කටයුතු කළ යුතු ය. ( )

(08) ගැටුමක් නිසා වැදගත් කරුණු අනාවරණය වන්නේ නම් එම ගැටුම ඵලදායි විය හැකි ය. ( )

(09) ගැටුම් නිරාකරණයට මැදිහත් වන සමථකරුවා හැමවිටම ඉවසිලිවන්ත පක්ෂපාතී කෙනෙකු විය යුතු ය. ( )

(10) රජය මගින් 'ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව' යටතේ හඳුන්වා දී ඇති ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකයේ (NVQ) නිපුණතා මට්ටම් හතක් දක්වා ඇත. ( )

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

(සුසංයෝජනය , සමාජ සුරක්ෂිතතාව , සාම්ප්‍රදායික , සමානුපාතික , සුසංහරණය , සමූපකාර , පොලිස්)

(11) ආයතනයක අනවශ්‍ය දෑ ඉවත් කිරීම ..................................................... ලෙස හැඳින්වේ.

(12) පුද්ගලයා සමාජයේ පවතින සිරිත් විරිත්, සමාජ ඇගයීම්, නීති රීති පිළිගනිමින් ඒවාට අනුකූලව ජීවත්වීම නිසා ..................................................... ඇතිවේ.

(13) 'එකා සැමටත් සැම එකාටත්' යනු ..................................................... ව්‍යාපාරයේ ආදර්ශ පාඨයයි.

(14) නව තාක්ෂණය හා සොයා ගැනීම නිසා පැරණි ..................................................... ක්‍රම සමාජයෙන් ඉවත්ව යා හැකි ය.

(15) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන්නේ ..................................................... නියෝජන ක්‍රමයයි.

Department of Education – Western Province

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා X කොටසේ ප්‍රකාශයට වඩාත් ගැළපෙන නිවැරදි පිළිතුර Y කොටසින් තෝරා අදාළ ඉංග්‍රීසි අක්ෂරය වරහන් තුළ යොදන්න.**

| X කොටස | | Y කොටස |
|---|---|---|
| (16) මුළු දිවයිනම එකම ඡන්ද කොට්ඨාසයක් ලෙස සලකා පවත්වන මැතිවරණය. | ( ) | A. මහා මැතිවරණය |
| (17) අනුරාධපුර යුගයේ මෙරට ක්‍රියාත්මක පළාත් පාලනයතන වර්ගයකි. | ( ) | B. පොලීසිය |
| (18) ප්‍රජාතන්ත්‍රවාදයේ සාර්ථකත්වයට හේතුවේ. | ( ) | C. නිදහස් ජන මාධ්‍ය |
| (19) රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීම තුළින් සමාජ සුරක්ෂිතතාවය ඇති කිරීමට කටයුතු කරයි. | ( ) | D. රට සභා |
| (20) වර්තමානයේ රටේ සියලු ආපදා සම්බන්ධීකරණය කරන රාජ්‍ය ආයතනයකි. | ( ) | E. ගම් සභා |
| | | F. ජනාධිපතිවරණය |
| | | G. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය |

(ලකුණු 20 x 2 = 40)

Department of Education – Western Province

## <u>II පත්‍රය</u>

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.**
- **තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

(01) ඔබ විසින් පාසලේ තුන්වන වාරය අවසානයේ සකස් කරන්නට යෙදුණු 'ප්‍රශ්නෝත්තර සංග්‍රහය' ආශ්‍රයෙන් පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

(1) එම ප්‍රශ්නෝත්තර සංග්‍රහය සැකසූ විෂය මාතෘකාව කුමක් ද? (ලකුණු 01)

(2) ක්‍රියාකාරකම ආරම්භයේ ඔබට ලැබුණු ගුරු උපදෙස් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(3) ඔබ කණ්ඩායම හෝ ඔබ සාදන ලද ප්‍රශ්නයක් හා පිළිතුර ලියා දක්වන්න. (ලකුණු 02)

(4) ප්‍රශ්න සැකසීමේ දී ඔබ / ඔබ කණ්ඩායම තොරතුරු සපයාගත් පෙළපොතට අමතර වෙනත් මූලාශ්‍ර 2ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(5) ඔබට මෙම ක්‍රියාකාරකම කිරීම තුළින් ලැබුණු අත්දැකීම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(6) ප්‍රශ්නෝත්තර සංග්‍රහය සැකසීමේ දී මතු වූ ගැටලු 2ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(7) ඔබට / ඔබ කණ්ඩායමට මතු වූ ගැටලු මඟහරවා ගැනීමට ගත් ක්‍රියාමාර්ග දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(8) මෙම ප්‍රශ්නෝත්තර සංග්‍රහය ඔබ පන්තියේ සෙසු ළමුන්ට පරිහරණය කරන්නට ඔබ/ ඔබ කණ්ඩායම ගත් ක්‍රියාමාර්ග තුනක් ලියන්න. (ලකුණු 03)

(02) පුද්ගලයා තුල විවිධ බුද්ධිමය හැකියා ඇත. එය බහුවිධ බුද්ධිය ලෙස හැඳින්වේ. ඒ අනුව,

(1) A. බහුවිධ බුද්ධි න්‍යාය හඳුන්වා දුන් තැනැත්තා

B. එම න්‍යායේ සඳහන් එක් බුද්ධිමය අවස්ථාවක් සඳහන් කරන්න. (ලකුණු 02)

(2) ශ්‍රී ලාංකික අනන්‍යතාව පිළිබිඹු කරන අංග 4ක් ලියා දක්වන්න. (ලකුණු 04)

(3) ස්ථිරසාරතාව සඳහා ප්‍රගුණ කළ යුතු ගුණාංග තුනක් සඳහන් කර ඉන් එක් අවස්ථාවක් ඔබ විසින් කටයුතු කළ ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 05)

(03) සමාජ සුරක්ෂිතතාව යනු සමාජයේ ආරක්ෂාව හෙවත් යහපැවැත්ම තහවුරු වීමයි.

(1) සමාජ සුරක්ෂිතතාව ඇතිවීම කෙරෙහි පුද්ගල චර්යා හැඩගැස්විය හැකි ආකාර දෙක සඳහන් කරන්න. (ලකුණු 02)

(2) සමාජ සුරක්ෂිතතාවයට බලපාන ආයතන හතරක් ලියා දක්වන්න. (ලකුණු 04)

(3) සමාජ සුරක්ෂිතතාවයට දායක වන ආයතනයක් ලෙස පොලීසියෙන් ඉටුවන කාර්යභාරය කරුණු 3ක් යටතේ විස්තර කරන්න. (ලකුණු 05)

(04) ප්‍රජාතන්ත්‍රවාදය යනු මහජනයා විසින් මහජනයා උදෙසා ක්‍රියාත්මක කරන මහජනයාගේ පාලන ක්‍රමයකි.

(1) පහත A හා B රූප සටහනේ දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කරන ආයතනයක් හා අවස්ථාවකි. ඒවා හඳුනාගෙන A හා B වශයෙන් නම් කරන්න. (ලකුණු 02)

A



B



ucation – Western Province

(2) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටවල් හතරක් ලියා දක්වන්න. (ලකුණු 04)

(3) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක පුරවැසියන් සතු සිවිල් අයිතිවාසිකම් තුනක් සඳහන් කර ඉන් එක් අයිතිවාසිකමක් භුක්ති විඳින ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(05) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවල ක්‍රියාකාරිත්වය අනුරාධපුර යුගයේ සිට ක්‍රියාත්මක වේ.

(1) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(2) ඔබ නම් කළ පළාත් පාලන ආයතනයක කාර්යයන් 4ක් ලියා දක්වන්න. (ලකුණු 04)

(3) පළාත් පාලන ආයතනවල සේවා ලබන මහජනතාව සතු යුතුකම් 5ක් සඳහන් කරන්න. (ලකුණු 05)

(06) (1) පහත සඳහන් අවස්ථාවල සිදු වියහැකි අනතුරු හා ආපදා සඳහා උදාහරණ එක බැගින් සඳහන් කරන්න.

A. පාසල ආශ්‍රිතව

B. වැඩබිම ආශ්‍රිතව (ලකුණු 02)

(2) අනතුරු හා ආපදා සම්බන්ධ කටයුතු කරන ආයතන 4ක් ලියා දක්වන්න. (ලකුණු 04)

(3) විපත් හා අනතුරු වළක්වා ගැනීමට කටයුතු කිරීම තුළින් හානි අවම කරගත හැකි ය. ඒ අනුව සුළි සුළං අවස්ථාවක ක්‍රියාකරන ආකාරය පහත ශීර්ෂ යටතේ කෙටියෙන් විස්තර කරන්න.

A සුළි සුළඟට පෙර

B සුළි සුළං අවස්ථාවේ

C සුළි සුළඟින් පසු (ලකුණු 05)

(07) ජීවිතයේ දී මුහුණ දෙන ගැටුම් විනාශකාරී නොවී විසඳා ගැනීම සමාජ ප්‍රගමනයට හේතු වේ.

(1) ගැටුමක් ඇතිවීමට බලපාන හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(2) ගැටුම්වල ප්‍රතිඵල ඇතැම්විට විනාශකාරී විය හැක. එවැනි අවස්ථා හතරක් ලියා දක්වන්න. (ලකුණු 04)

(3) ගැටුම් නිරාකරණයේ දී සමථකරුගේ කාර්යභාරය කරුණු 3ක් යටතේ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

Department of Education - Western Province